# හාවාගේ කැරට් කොටුව




ඩි.එම්.අනුත්මි නෙතුල්යා දසනායක

මහ/මහාමායා බාලිකා විදුහල

3 ශ්‍රේණිය B

# හාවාගේ කැරට් කොටුව

ඩී.එම්.අනුත්මි නෙතුල්යා දසනායක

# පිදුම

යහගුණ සමඟින් අකුරු කරමින්

දිවිය වර්ණවත් කළ

මාගේ ආදරණීය

දෙමව්පියන්ටත්, සහෝදරිය

විහාරාටත්, මාගේ වත්සලා

ගුරුතුමිය ඇතුළු සියලු

ගුරුමෑණිවරුන්ටත්

සෙනෙහසින් පුදමි...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන

“හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමාන ය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක රටක හා පැංචෙක් ජීවත් වුණා. මේ හා පැංචා හරිම අකීකරුයි. එක දවසක් හා පැංචා කැරට් ගලවන්න එයාගේ කුඹුරට ගියා. ඉත්තෑරාල දැක්කා හා පැංචා කැරට් ගලවනවා.




ඉත්තෑරාල, හා පැංචාට කතා කළා. හා පැංචා අහක බලාගෙන හිටියා. අප්පේ, මෙයානම් හරිම අකීකරුයි. හා! බලමුකෝ, මං හොඳ පාඩමක් උගන්වන්නංකෝ.




ඉත්තෑරාල කල්පනා කළා. එක පාරටම අදහසක් ආවා.
ඉත්තෑරාල හා පැංචාගේ කුඹුරේ තියන කැරට් ටික ගැලෙව්වා.





හා පැංචා තව සතියකින් විතර එයාගේ කුඹුරට ආවා.

එයා මේක දැකලා පුදුම වුණා.



හා පැංචා උදේ  ඉඳන් රෑ වෙනකම් කැරට් ටික හෙව්වා.


අන්තිමේ දී හා පැංචට හොඳටම නින්ද ගියා.




හා පැංචා ඇහැරලා බලද්දී, එයාට ගසක් යට නින්ද ගිහිල්ලා. ඒත් හා පැංචාට තවම මහන්සියි.



ඉන්පසු ආයෙත් ඉත්තෑවා ආවා. හාවා ඉත්තෑවා දැක බය වුණා. ඉත්තෑවා කිව්වා අනේ! යාළුවේ බය වෙන්න එපා. ඔයා එදා මට කතාකරපු නැති නිසා මට තරහා ගියා. ඒ නිසා මම ඔයාගේ කුඹුරේ කැරට් ඔක්කොම ගැලෙව්වා.



අනේ ඇයි? ඉත්තෑ යාළුවේ එහෙම කළේ. මම දැන් කන්නේ මොනවාද? මට හොඳටම බඩගිනියි. ඔයා ඇයි, ඔච්චරම නපුරු වුණේ? ඉත්තෑවට දුක හිතිලා කිව්වා. මම ආයෙ කවදාවත් මේ වගේ නරක වැඩ කරන්නෙ නැහැ. අපි දෙන්නම එකතු වෙලා අලුතින් කැරට් පාත්තියක් හදමු. හාවාට හරිම සතුටුයි.




පසුදා ඉත්තෑවා උදේම ආවා. හාවාට හරිම සතුටුයි. ඒ දෙදෙනාම කුඹුරට ගියා.



දෙදෙනාම එකතු වෙලා ලස්සන පාත්තියක් දැම්මා.

කැරට් ඇට පැළ කළා.



ටික දවසක් ගිහිල්ලා, හාවා කුඹුරට ආවා. හාවාට පුදුම සතුටක්. කැරට් පාත්තිය ලස්සනට පැළ වෙලා.

ඉත්තෑවාට හරිම සතුටුයි.



අපි හැමෝම එකතු වෙලා වැඩ කරනවා නම් අපිට කොච්චර වැඩ කරන්න පුළුවන්ද? කියලා හාවා කිව්වා


දෙදෙනාම සතුටින් ගියා.

කාලයකට පසු ගොවි මාමෙක් ආවා. ඔහු මේ කැරට් කොටුව දැක ඉතාමත් සතුටු වුණා. කවුද මේ කැරට් කොටුව හැදුවේ කියලා ගොවි මාමා ඇහුවා.

අපි ඔක්කොම එකතු වෙලා තමයි මේ කැරට් කොටුව හැදුවේ කියලා කිවුවා. ඔය හැමෝම ගොඩක් දක්ෂයි. හැබැයි, මම ආසයි මේ කුඹුරේ තව එළවළු පැළ වගා කරන්න හැමෝම කැමතිද?කියලා

ගොවිමාමා ඇහුවා හැමෝම ඒ අදහසට කැමති වුණා. තව සති කිහිපයකින් පසු කුඹුර ලස්සනට සකස් කරලා පාත්ති සෑදුවා. ඊට පසු එළවළු ඇට පැළ කළා. හැමෝම මේක දැකලා ගොඩක් සතුටු වුණා.





දවසින් දවස පාත්තිවල එළවළු පැළ දලු දානවා. දැන් ඉතිං, හාවාටයි, ඉත්තෑවටයි, ගොවිමාමාටයි, හරිම සතුටුයි.



ගොවි මාමා දවසක් කිව්වා, එළවළු කොටුව මට රෑට හීනෙනුත් පේනවා කියලා.

හාවාට දැන් හොඳටම කන්න කැරට් තියෙනවා. හාවා පැන පැන යමින් සිනාසෙනවා.



ගොවි මාමා උදෑසනින් පැමිණ එළවළු කොටුවේ එළවළු කඩාගෙන පොළට යනවා.

දැන්, හාවයි, ඉත්තෑවයි, ගොවි මාමාටයි තුන්දෙනාට ම හරිම සතුටුයි. අපි තුන්දෙනා එකතුවෙලා කරපු වැඩේ නිසා හැමෝටම යහපතක් සිදුවුණා.

අපි එකතුවෙලා සමඟියෙන් වැඩ කරනවානම් ලෝකය ජයගන්න හැකිවේවි.

පුංචි වුණත්, අපි සමගියෙන් වැඩ කරමු. ලොව ජය ගනිමු.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්,ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන්ට ඩිජිටල් වේදිකාවක් ගොඩනගා තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ප්‍රකාශිත දිනය : 2025.02.08

ISBN 978-624-208-314-8

Rs.300/=